| | | | |
|---|---|---|---|
| தொலைபேசி elephones | 011-2136600 011-2136650 | எனது இல. My No. | PSC/APL/14/2/2026 |
| ලේකම් சயலாளர் ecretary | 011-2136602 | | |
| ෆැක්ස් தொலைநகல் ax | 011-2876169 011-2876181 | ඔබේ අංකය உமது இல. Your No. | MWFRC/ADM/FC/16-02/03 |
| විද්‍යුත් තැපෑල மின் - அஞ்சல் - mail | info@psc.gov.lk | | |
| වෙබ් අඩවිය இணையத்தளம் /ebsite | www.psc.gov.lk | දිනය திகதி Date | 2026.03. 16 |

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


**ලේකම්**
පරිසර අමාත්‍යාංශය

**<u>2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - බීට්ටු වන නිලධාරී</u>**

බීට්ටු වන නිලධාරීන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ එවමි.

02) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු 2026.04.02 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. 2026 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද එකී නිශ්චිත දිනවල අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක විය යුතු වේ. ඒ අනුව බීට්ටු වන නිලධාරීන්ගෙන් 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුම්වත් කරන ලෙස මෙයින් දන්වමි.

03) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙන ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඇ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙස ම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05) 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම අමාත්‍යාංශ ලේකම් ගේ සහ සියලුම ආයතන ප්‍රධානීන් ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07) තවද, 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස් වීම් හේතුවෙන් යම් නිලධරයෙකු ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටලුසහගත තත්වයක් පවතින අවස්ථාවක දී, අදාළ නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

08) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේ දී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වා සිටින අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

Mday

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

බීට්ටු වන නිලධාරී වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ - **2026**

| අනු අංකය | නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ඒ.එම්.ඩී.අයි. පුෂ්පකුමාර මහතා | බීට්ටු වන නිලධාරී - II වන ශ්‍රේණිය | කුරුණෑගල/මහව/ නිකවැරටිය | අනුරාධපුර/තඹුත්තේගම/ ගල්නෑව | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |
| 2 | වී.ජී.එම්. පද්ම කුමාර මහතා | බීට්ටු වන නිලධාරී - III වන ශ්‍රේණිය | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | කළුතර/මතුගම/ ගුලවිට | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |

2026/03/10